We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
Immigration Lawyer
Migration Agent Reg: 96/86306

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002

3 වන පිටෙන්

මුත්තූර් දෙමළ, මුස්ලිම් අරගලය නිසා චන්ද-ාරමුල්ල ප්‍රදේශයේ පිපිර වූ ක්ලේමෝ බෝම්බයෙන් සෙබළුන් දෙදෙනෙක් බරපතල තුවාල ලැබුවා. දෙමළ ජාතික සන්ධානයේ ජෝශප් පරරාජසිංහම් ඝාතනය කළා. පේදුරු තුඩුවේදී හමුදාවේ දස දෙනකු මරුමුවට පත් වුණා.

යුද්ධයක් එයිද කියන අවිනිශ්චිත වාතාවරණය උඩ ආණ්ඩුවේ ප්‍රධාන දේශපාලනඥයනුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට සහය පළ කරන සියළුදෙනාත් මේ වෙලාවේදී කරන්න ඕනේ මොකක්ද? ජනාධිපතිතුමාව දංගෙඩියට තල්ලු කරන එකද? කොටින්ට සිය බලය තහවුරු කර ගන්න දැනුවත්ව හෝ නොදැනුවත්ව උදව් උපකාර කරන එකද? ජනාධිපතිතුමාගේ ඔලුවට ජාතිවාදී විෂබීජ ඇතුල් කරමින් ඔහු හරහා මුළු රටම මහා ව්‍යසනයකට තල්ලු කිරීමද? දැන් සිද්ධ වෙන කරුණු අනුව නම් මට පෙනෙන්නේ ඉහත සඳහන් කාරණා තුනම සිදුවෙමින් පවතින බවයි. සාමය උදා වෙන්නේ කවදාදැයි ඇඟිලි ගනිමින් සිටි ජනතාවට අහුමුළුවල සැඟවී යුද්දේ එන්නේ කවදාදැයි දැන් ඇඟිලි ගණන් කරන්නට සිදුවී තිබෙන බවයි. එය මහා ඛේදවාචකයයි. බියකරු සිහිනයකි. සිහිනෙන්වත් නොපැතිය යුත්තකි.

මහින්ද රාජපක්ෂ ජනාධිපති පදවියට පත්වුණ ගමන්ම සිංහල ජාතිවාදී බලවේග දැළක් ඔහු වට කරගත් බවයි මට නම් පෙනෙන්නේ. ''අපි සිංහළ, අපි බුද්ධාගමේ, ලංකාවේ අපේ රට, දෙමළා දෙවැනි ජාතිය, ප්‍රභාකරන් කොටියා, කොටි සංවිධානය වනසන්න ඕනේ......'' මෙහෙම හිතන්න අපි පෙළඹෙනවා. ප්‍රභාකරන්ගේ මිනීමරු කොටි සංවිධානය වසර විසිපහක් තිස්සේ ශ්‍රී ලංකාවේ ජන නායකයින්, ජනතාව, භික්ෂූන්, මරා දමමින් වෙහෙර විහාරස්ථාන ඇතුළු ජාතික ආර්ථික ධර්මස්ථාන වනසමින් මුළු රටම අමු සොහොනක් කළ හැටි අපට අමතක කරන්න බැහැ. ඒ නිසා අපි හිතන්න පෙළඹෙනවා අර විදිහට. ජනතාව හැටියට අපි එහෙම හිතන එක සාධාරණයි. නමුත් රටට, ජාතියට, ජාත්‍යන්තර ප්‍රජාවට වගකිවයුතු දේශපාලනඥයින් ජනතාව හිතන විදිහට හිතන්න ගියොත් වැඩ වරදිනවා. ඔවුන් බොහෝම උපක්‍රමශීලී වෙන්න ඕනේ. බොහෙ-ා්ම ඈතට කල්පනා කරලා බලලා තිරණ ගන්න ඕනේ. තුරුම්පු හංගා ගෙන කොර අත දිනන්න තරම් ශූර වෙන්න ඕනේ. ඒත් දැන් සිද්ධ වේගෙන යන්නේ අතේ තියෙන කාඩ් කුට්ටම ප්‍රභාකරන්ට පෙන්නලා එයාට තුරුම්පු ගහලා අපිව කපා ගන්න පුළුවන් විදිහට බාල්දු කොළත් ඇදලා දෙන එකයි. කොටින්ම කියනවා නම් සතුරගේ අතට අපිතවත් ආයුධ දෙන එකයි කරන්නේ. ඇයි එහෙම කියන්නේ.

අපේ කාඩ් කුට්ටමේ හිටපු 'තොණ්ඩමන්' කියන හොඳම තුරුම්පුව පසුගියදා අිප ප්‍රභාකරන්ට පූජා කළා. ආරුමුගම් තොණ්ඩමන් එකා කම්කරු කොංග්‍රසයේ නායකයා විතරක්ම නෙමෙයි. එයා කොටි සංවිධානයත් සමග සම්බන්ධකම් නොපවත්වපු සිංහල දේශපාලන නායකයින් එක්ක ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සිටි දෙමළ දේශපාලන නායකයෙක්. ඉන්දියාවේ රාජ්‍ය නායකයින්, ප්‍රාන්ත නායකයින් එක්ක කිට්ටු සම්බන්ධකම් තිබෙන පුද්ගලයෙක්. උඩරට වතුකරය තමන්ගේ යටතට ගන්න, එහි ආයුධ ගබඩා කරන්න ප්‍රභාකරන්ගේ අනුදැනුම මත කොටි ගෝල බාලයෝ වතුකරය රිංගපු වෙලාවේදී උන්ට ගහලා පන්නා ගත්තේ තොණ්ඩමන්. ඒ කියන්නේ තොණ්ඩමන් ආණ්ඩුවේ සිටියත්. විපක්ෂයේ සිටියත් හිටියේ සිංහල නායකයින් එක්කයි. තොණ්ඩමන් එයාට වාසි ලබා ගන්නා ආකාරයට එයාගෙම දේශපාලන න්‍යාය පත්‍රයක් හදාගෙන එජාපයෙන්, පොදු පෙරමුණෙන් දේශපාලන නායකයින් අල්ලේ නටවපු බව ඇත්ත. පසුගිය ජනාධිපතිවරණයේදී එයා මහින්ද රාජපක්ෂ අපේක්ෂකවරයා දිනවන්න ඔහුගෙන් යම් යම් වාසි බලාපොරොත්තු වුණ බවත් ඇත්ත. ඒවා නොලැබුණ තැන තොණ්ඩමන් රනිල්ට සහය දුන් බවත් ඇත්ත. ඒ විතරක් නෙමෙයි. ජනාධිපතිවරණයේදී උඩරට වතුකරයේ විශාල ඡන්ද ප්‍රමාණයක් රනිල්ට ලබා දී වතුකරයෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපති අපේක්ෂකයා පරාජයට පත් කළ බවත් ඇත්ත. එහෙම වුණා කියලා තොණ්ඩමන් ප්‍රභාකරන් ළඟට තල්ලු කරපු එක තමයි තිත්ත.

මීට අවුරුදු දෙකකට විතර ඉස්සෙල්ලා තමිල් සෙල්වම් උඩරට වතුකරයේ සංචාරයක් කරන්නට සූදානම් වූ වෙලාවේ ඒකට හරහට හිටියේ තොණ්ඩමාන්. තමිල් සෙල්වම්ව වතුකරයට කැඳවා ගෙන එන්න පාවඩ එලන්න බලාපොරොත්තුවෙන් හිටියේ වතුකරයේ තොණ්ඩමන් ප්‍රතිවාදියාය. ඒ කියන්නේ කඳුරට පෙරමුණේ නායක පී. චන්ද්‍රසේකරන්. තොණ්ඩමන් දැන ගත්තා එනපොට හොඳ නැති බව. තමන්ගේ පොලිස් ආරක්ෂාවත් අඩු කරලා කාර්යාලයක් පොලීසියෙන් වට කරවලා පරීක්ෂා කරවලා එතැනිනුත් නවතින්නේ නැතිව ලංකා කම්කරු කොංග්‍රසයත් දෙකඩ කරවන්න ආණ්ඩුව ගහන ප්ලෑන තොණ්ඩමන් තේරුම් ගත්තා. ඒ නිසා එයා වහාම තමන්ගේ ප්‍රතිවාදියා, කොටි සංවිධානයේ උඩරට වතුකරයේ නියෝජිතයා වන චන්ද්‍රසේකරන් සමග එකතු වුණා. එහෙම එකතු වෙලා මොනවද කිව්වේ? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමයි, එයාගේ ආණ්ඩුවයි දකුණේ ජාතිවාදී බලවේග එක්ක එකමුතු වෙලා දෙමළ ජාතිය විනාශ කරන්න හදන නිසා අපිත් (උඩරට) උතුරත් එකතු වෙලා ශක්තිමත් සංධානයක් හදලා ආණ්ඩුවේ අභියෝගවලට මුහුණ දෙමුයි කියලා.

**මේ කාරණාවලින් පෙනෙන්නේ මොකක්ද? සාමය වෙනුවට යුද්ධය අත වනනා බවක් නේද? කොටි දැන් උතුරෙත් නැගෙනහිරත් දිග්ටම මිනී මරන්න පටන් අරගෙන. හැබැයි ඒ මිනී මරන්නේ කොටි සංවිධානය නෙමෙයි කියලයි එයාලා කියන්නේ.**

සිංහල රාජ්‍ය නායකයන් සමග සමගියෙන් රටේ පාලනයට හවුල් වූ කිසිම දෙමළ දේශපාලන නායකයෙක් මෙපමණ කාලයකට දකුණේ සිංහල ආණ්ඩුව ජාතිවාදීයි කිව්වේ නැහැ. ඒ කතාව තොණ්ඩමන් කිව්වේ විතරක් නෙවෙයි. කිලිනොච්චියට ගිහින් කොටි සංවිධානයේ තමිල් වෙල්වම් හා පුලීදේවන් මුණ ගැසී කතාබහක් කළා. කොටි සංවිධානයට ඒ තරම් 'රසවත් ප්‍රවෘත්තියක් පරණ අවුරුද්ධ පුරාවටම ලැබුණේ නැහැ. දකුණේ ආණ්ඩුව ජාතිවාදී එකක් බවට කොටි සංවිධානය ගහපු 'රැකෝඩ්' ජාත්‍යන්තරය විශ්වාස කළේ නෑ. හිටපු විදේශ අමාත්‍ය දිවංගත ලක්ෂ්මන් කදිර්ගාමර් මහතා කොටි ත්‍රස්තවාදීන්ගේ අභ්‍යන්තර අරමුණු හා

14 වන පිටට